**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**

# ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (මධ්‍යම පළාත) සභාපති විසින්, මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන කාර්යයන් සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. කොන්ත්‍රාත්තුවේ විස්තර

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්තුවේ නම | ඉංජිනේරු ඇස්තමේන්තුව (අවිනිශ්චිත වියදම් හා 20 % ලාබාංශ රහිතව) (රුපියල් මිලියන) | ලංසු ආරක්ෂණය (රුපියල්) | කොන්ත්‍රාත් කාලය (කැලැන්ඩර දින) | CIDA ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| 01 | RDA/CP/PD/2023/25 | පේරාදෙණිය-දෙල්තොට-රිකිල්ලගස්කඩ මාර්ගයේ (13+450) කි.මී. වෙත අවශ්‍ය ඇස්පෝල්ට් වෙයාරින්කෝස් (Asphalt Wearing Course) මෙ.ටොන් 560 ක් සපයා ප්‍රවාහනය කර දීම. | 11.7 | 290,000.00 | 90 | |
| 02 | RDA/CP/PD/2023/26 | පේරාදෙණිය-දෙල්තොට-රිකිල්ලගස්කඩ මාර්ගයේ (15+000) කි.මී. වෙත අවශ්‍ය ඇස්පෝල්ට් වෙයාරින්කෝස් (Asphalt Wearing Course) මෙ.ටොන් 570 ක් සපයා ප්‍රවාහනය කර දීම. | 11.8 | 295,000.00 | 90 | |
| 03 | RDA/CP/PD/2023/27 | මහනුවර නගරයේ අස්ගිරිය අතුරු මාර්ගය වෙත අවශ්‍ය ඇස්පෝල්ට් වෙයාරින්කෝස් (Asphalt Wearing Course) මෙ.ටොන් 715 ක් සපයා ප්‍රවාහනය කර දීම. | 14.7 | 352,000.00 | 90 | |
| 04 | RDA/CP/PD/2023/28 | මහනුවර නගරයේ ජ්.ජ්. ධර්මසේන මාවත වෙත අවශ්‍ය ඇස්පෝල්ට් වෙයාරින්කෝස් (Asphalt Wearing Course) මෙ.ටොන් 213 ක් සපයා ප්‍රවාහනය කර දීම. | 4.3 | 105,000.00 | 90 | |
| 05 | RDA/CP/PD/2023/29 | මාරස්සන කන්දකැපුතැන්න මාර්ගයේ (3+750-7+070) කි.මී. වෙත අවශ්‍ය ඇස්පෝල්ට් වෙයාරින්කෝස් (Asphalt Wearing Course) මෙ.ටොන් 300 ක් සපයා ප්‍රවාහනය කර දීම. | 6.2 | 154,000.00 | 90 | |
| 06 | RDA/CP/PD/2023/30 | ලක්ෂපාන-පොල්පිටිය-කලුගල මාර්ගයේ 0+000-7+000 කි.මී. දක්වා චිප්ස් යොදා තාර ආලේප කිරීම. | 8.8 | 214,000.00 | 90 | C4, C5, C6 |
| 07 | RDA/CP/PD/2023/31 | බලැක්පූල්-අඹේවෙල-පට්ටිපොල-හෝර්ටන්තැන්න මාර්ගයේ අංක 11/1 දරන බෝක්කුව සහ කොන්ක්‍රීට් කාණු පද්ධතිය ඉදි කිරීම | 12.9 | 310,000.00 | 120 | C4, C5, C6 |
| 08 | RDA/CP/PD/2023/32 | පේරාදෙණිය-හල්ඔලුව-කටුගස්තොට-මාර්ගයේ 3+000-5+000 කි.මී. දක්වා මාර්ගයේ බෑවුම ආරක්ෂා කිරීම සඳහා පැති බැම්ම සහිත කොන්ක්‍රීට් කාණු ඉදි කිරීම. | 6.1 | 150,000.00 | 90 | C4, C5, C6, C7 |

03. ලංසුව, ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතු අතර **2023.12.08 දින දක්වා එකී ලංසු ආරක්ෂණය වලංගු විය යුතුය.** ලංසු ආරක්ෂණයක් නොමැති ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ලංසුකරුවන්ට කාර්යාල වේලාවන් තුළ පහත සඳහන් කාර්යාලයෙන් **2023.08.02** වන දින සිට **2023.08.09** 9.00 පැය සිට 15.00 පැය අතර කාලයේදී ලංසු පිළබඳව වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

- ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, මහනුවර
- දු.ක.අංකය - 0812-222005 ෆැක්ස් - 0812-222005 විද්‍යුත් තැපැල් - cekandyrda@gmail.com
- ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, නුවරඑළිය
- දු.ක.අංකය - 0522-222552 ෆැක්ස් - 0522-222553 විද්‍යුත් තැපැල් - nuwaraeliyace@gmail.com
- පළාත්භාර අධ්‍යක්ෂ (ම.ප), මාර්ග සංවර්ධන අධිකාරිය, අස්ගිරිය, මහනුවර.
- දු.ක. අංකය - 0812-232119 ෆැක්ස් - 0812-237931 විද්‍යුත් තැපැල් - pdcentral123@gmail.com

05. පොදු මුදල් චක්‍රලේඛ අංක 04/2016(ii) අනුකූලව ලංසු කැඳවීම ජාතික කොන්ත්‍රාත්කරුවන් අතර තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදු කරනු ලැබේ. මධ්‍යම පළාත තුළ ලියා පදිංචි ලංසුකරුවන් ගේ ලංසු සඳහා 5% ක අභිරුචියක් ලබා දෙනු ඇත. ඕනෑම ලංසුකරුවෙකු කොන්ත්‍රාත් ප්‍රධානය සඳහා සුදුසුකම් ලැබීමට නම් එම ලංසුකරු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි ඉහත වගුවෙහි සඳහන් "මහා මාර්ග" කාණ්ඩයෙහි ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට ලියාපදිංචි වී සිටිය යුතු වේ.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් මහනුවර අස්ගිරියෙහි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් භාර අධ්‍යක්ෂ (ම.ප) කාර්යාලයෙන් ලංසු ලේඛණ කාර්යාලීය වේලාව තුළදී කිසිදු ගාස්තුවකින් තොරව පරීක්ෂා කිරීම කළ හැකි අතර **2023.08.02** දින සිට **2023.08.09** දින දක්වා 09.00 පැය සිට 15.00 පැය කාලය තුළ ආපසු නොගෙවනු ලබන රු. 9,435.90 ගාස්තුවක් (බදු සහිතව) සමග ලිඛිත අයදුම්පතක් යොමු කිරීමෙන් සම්පූර්ණ අයදුම්පත් කට්ටලයක් ලබා ගත හැකිය.

07. 1987 අංක 3 දරන පොදු පනත අනුව මිලියන 5 ට වැඩි ලංසු සඳහා ලංසුකරුවන් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සහතිකය සමග ලංසු ඉදිරිපත් කළ යුතුය.

08. සම්පූර්ණ කළ ලංසු පිටපත් දෙකකින් යුක්තව ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුව සහ අංකය සඳහන් කර සභාපති. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව. මාර්ග සංවර්ධන අධිකාරිය. තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර යන ලිපිනයට **2023.08.10** දින **14.00** පැයට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද ලංසු විවෘත කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදින **14.30** පැයට ලංසුකරුවන් හෝ ඔවුන් විසින් තෝරා එවූ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති.**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව(මධ්‍යම පළාත)**
**පළාත්භාර අධ්‍යක්ෂ(ම.ප) කාර්යාලය.**
**මාර්ග සංවර්ධන අධිකාරිය.**
**තැ.පෙ.100, අස්ගිරිය. මහනුවර.**